


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ නවම් මස කලාපය, රා. ව. 2017 ක් වූ පෙබරවාරි මස 10 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# බුදු නුවනට පමණක් පෙනුනු කර්මය බෙදෙන ආකාරය.

**"ඉති ඛො ආනනද, අත්ථි කමමං අභබබං අභබබාසං, අත්ථි කමමං අභබබං භබබාසං, අත්ථි කමමං භබබකෙදචව භබබාසකදච, අත්ථි කමමං භබබං අභබබාසනතීති."**

**ආනන්දය, අකුශලය මැඩලන අකුශල කර්මයක් ඇත. කුශලය මැඩලන අකුශල කර්මයක් ඇත. කුශලය මැඩලන කුශල කර්මයක්ද ඇත. අකුශලය මැඩලන කුශල කර්මයක්ද ඇත.**

**(මහාකම්ම විභඞ්ග සූත්‍රය)**

ධම්කාමී පින්වතුනි,

අද නවම් පුර පෝ දිනයයි. බුදුරජාණන් වහන්සේ ප්‍රථම සංඝ සම්මේලනය පැවැත්වීම, අග්‍රශ්‍රාවකයින් වහන්සේලා පත්කිරීම, ඕවාද ප්‍රාති මෝක්ෂය දේශනා කිරීම, ආයු සංස්කාරය හැරීම වැනි උතුම් සිද්ධීන් සිහිපත්වන අද දින දහම් පණිවුඩයට මාතෘකා කරන ලද්දේ මජ්ඣිම නිකායට අයත් විභඞ්ග වග්ගයෙහි මහා කම්ම විභඞ්ග සූත්‍රයයි. භාග්‍ය වතුන් වහන්සේ රජගහනුවර කලන්‍දක නිවාප නම් වූ වේළුවනයෙහි වැඩ වසන දිනක දේශනා කරන ලද ධර්මයකි.

වනය තුළ කුටියක වැඩ වසන සමිද්ධි නම් ස්වාමීන් වහන්සේගෙන් පෝතලි පුත්‍ර නම් පරිව්‍රාජකයෙකු සිතින්, කයින්, වචනින් කර්ම කොට කිනම් වේදනාවක් විඳී දැයි විමසීය. අකුශල කර්මය සඳහාම විමසනවා යයි සිතා, සිතින් කයින් වචනින් දැන දැන කර්ම කිරීමෙන් දුක්වේදනා හිමිවන බව කියන ලදී. පරිව්‍රාජකයා එය නොපිළිගෙන බැහැරත් නොකොට හුනස්නෙන් නැගී ගිය පසු සමිද්ධි තෙරුන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ගෙ අනුග්‍රහයෙන් බුදුහිමියන් හමුවට ගොස් සිදු වූ තතු පැහැදිළි කළේය. බුදුරජාණන් වහන්සේ කරුණු විමසා සමිද්ධි තෙරුන් වහන්සේට අවවාද කොට මොහු විසින් පෝතලි පුත්‍ර පරිව්‍රාජකයාට බෙදා ප්‍රකාශ කලයුත්තක් ඒකාන්තයෙන් විසඳා ඇතැයි වදාළහ. ''කයින් වචනින් මනසින් දැන දැන සුඛ වේදනාවට හේතු වූ කර්ම කොට සැප විඳී. දුක් වේදනීය කර්ම කොට දුක් විඳී. දුක් සහ සුඛ නොවූ කර්ම කොට උපේක්ෂා වේදනා විඳී යයි කීවේ නම් අඩු තරමින් ඉතා හොඳ පිළිතුරක් යයි වදාළහ. නමුත් ආනන්දය, ලොව උපන් සත්වයා විඳින කර්මවිපාක පිළිබඳව අවබෝධය පෝතලී පුත්‍ර පරිව්‍රාජක වැනි බාලවූ අන්‍ය දෘෂ්ටිකයෝ කෙසේ දැනගනීද? තථාගතයන්ගේ මහා කම්ම විභංගය (කර්මය පිළිබඳ බෙදා දක්වන ලද සත්‍ය දේශනාව) ආනන්ද, එය තොප විසින් අසා ධරන්නේ නම් ඉතා හොඳයි යනුවෙන් වදාළහ.

භාග්‍යවතුන් වහන්ස! මහා කම්ම විභංගය දේශනා කරන සේක්වා! අප ඔබ වහන්සේගෙන් අසා ධරන්නාහ ''යි කීය. එවිට බුදු හිමියන් ආනන්ද, ලෝකයෙහි දක්නට ලැබෙන පුද්ගලයෝ සතර දෙනෙක් වෙති.

(1). යමෙක් දස අකුශල් හෙවත් ප්‍රාණඝාතය, හොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, කේලාම් කීම, පරුස වචන කීම, හිස් වචන කීම, විෂම ලෝභය, තරහව, වැරදි දෘෂ්ඨිය යන පාපකර්ම සිදුකොට මරණින් මතු නරකයෙහි උපදියි.

(2). ආනන්ද, මෙලොව යමෙක් ඉහතකී දස අකුශල් කොට මරණින් පසු සුගතියෙහි උපදී.

(3). යමෙක් ඉහත කී දස අකුශලයෙන් වැළකී ජීවත් වී මරණින් මතු සුගතියෙහි උපදී.

(4). තවත් යමෙක් දස අකුශලයෙන් වැළකී ජීවත් වී මරණින් පසු නරකයෙහි උපදී.

කපළමු පුද්ගලයාගේ කර්මය තථාගත මහා කම්ම විභංග ඥාණය හෙවත් බුදු නුවනින් බෙදා දැක්වීම.

ආනන්ද, මෙලොව කිසියම් මහණෙක් බමුණෙක් හෝ හිත සමාධිගත කොට ශුද්ධියට පැමිණ මනුෂ්‍ය ඇස ඉක්මවා දිවැසින් ඉහත කී පළමු පුද්ගලයා නිරයෙහි උපන් බව දකීනම් ඔහු මෙසේ කියයි. ''ලොව පාපකර්ම ඇත. එසේම එහි විපාකද ඇත. ඒ නිසා දස අකුශල් කරන සැවොම මරණින් මතු නරකයෙහි උපදී. යම් කෙනෙක් මෙය මෙසේ දනීද ඔහු නිසි පරිදි දන්නෙකි නැතහොත් ඔහුගේ ඥාණය මිත්‍යාවකි''.

ආනන්ද, ඔහු එසේ සිතනුයේ ඔහුගේ දැනීම අනුවයි එම දෘෂ්ටියෙහි දැඩිව වැදගෙනයි. නමුත් බුදු නුවනින් කර්ම විපාක දැක බෙදා දැක්වීම හෙවත් මහා කම්ම විභංගය අනුව ඔහුගේ කියමනෙහි ''පාප කර්ම ඇත විපාක ඇත'' යන කීම අනුමත කරමි. දස අකුශල් කර මරණින් මතු නරකයෙහි ඉපදෙනු දුටිමියි කීම අනුමත කරමි. එසේ දස අකුශල් කර මරණයට පත්වන සැවොම නිරයෙහි උපදී යන කීම අනුමත නොකරමි. තමන් දකින ආකාරය නිවැරදිය එය අනුමත නොකරන සැවොම අනුවනයෝය යන ඒ කියමනද අනුමත නොකරමි. ආනන්දය, ඉහතකී පළමු පුද්ගලයා දස අකුශල් කරමින් ගොස් නිරයෙහි ඉපදීමට හේතු වූ එම පාප කර්මය වෙනත් කරන ලද පාප කර්මයන්ට වඩා බලවත්ව බොහෝ සෙයින් කිරීම හෝ දුකට හේතු වූ ඒ පාප කර්මය පසුව හෝ කිරීමත් මරණාසන්නයේදී මිථ්‍යාදෘෂ්ටිය සම්පූර්ණ කරනලද නිසාය. ඊට පෙර හෝ පසු කරනලද සෙසු ප්‍රාණඝාත ආදී දස අකුශල් විපාක ඔහුට ඒ ආත්මයේදී හෝ අනතුරු භවයක හෝ ආසන්න භවයකදී විපාක දෙන්නේමය. ආනන්ද, ඒ අනුව අකුශලය මැඩලන අකුශලයක් ඇත. (අත්ථි කම්මං අභබ්බං අභබ්බාසං) යනුවෙන් වදාළහ.

ක දෙවන පුද්ගලයාගේ කර්‍මය බෙදා දැක්වීම

ආනන්ද, ඉහතකී දෙවෙනි පුද්ගලයා මරණින් මතු උපදින ආකාරය දකින දිවැස් ඇත්තා මෙසේ කියයි ''පාප කර්මයෝ නැත. දුශ්චරිතයෙහි විපාකයක් නැත. දස අකුශල් කරන හැම දෙනාම මරණින් මතු සුගතියෙහි උපදිනු මම දැක්කෙමි. ඒ නිසා යම් කෙනෙක් මම දකින ආකාරය ඉගෙන දරා ගනීද ඔහු ප්‍රඥවන්තයෙකි. යමෙක් එය ඉගෙන නොගනීද ඔහුගේ දැනුම හිස්ය'' යනුවෙන් කියා එම දෘෂ්ඨියෙහි ඔහු තදින් බැඳී එයම සත්‍ය ලෙස පිළිගනී.

ආනන්ද, ඔහු විසින් ''පාපකර්‍ම නැත විපාක නැත'' යන කියමන අනුමත නොකරමි. දස අකුශල් කරපු කෙනෙකු මරණින් මතු සුගතියෙහි උපදිනු දුටිමිය කියමන අනුමත කරමි. එනමුත් දස අකුශල් කරන හැමෝම මරණින් මතු සැප ඇති සුගතියෙහි උපදිතිය යන කීම අනුමත නොකරමි. තව ද ඔහුගේ දැනීම නිවැරදිය වෙනත් දැනුම මිත්‍යා'යි කීම අනුමත නොකරමි. ඒ කිනම් හේතුවක් නිසාද ඉහත කී දෙවෙනි පුද්ගලයා දස අකුශල් කර සුගති ගාමී වූයේ සුගතියට හේතු වූ කුශලය බොහෝ කරන ලද නිසා හෝ මරණාසන්න කාලයේදී සම්මාදිට්ඨිය (නිවැරදි පිළිගැනීම) සමාදාන කරන ලද හෝ නිසාය, කරන ලද සෙසු දස අකුශල් විපාක මෙලොවදී හෝ අනතුරු භවයක දී හෝ ආසන්න භවයකදී හෝ විපාක දෙන්නේමය. (අත්‍ථි කමමං හබබං අභබබාසනති ) අකුශලය යටපත් කරන කුශල කර්‍ම ඇත.

ක තුන්වන පුද්ගලයාගේ කර්‍මය විභාග කිරීම.

ආනන්දය, ඉහත කී ''තුන්වන පුද්ගලයා දස කුශල් කොට ජීවත්ව සුගතියෙහි උපදිනු දකින දිවැස් ඇත්තා මෙසේ කියයි'' යහපත් කුශල කර්‍ම ඇත. එහි විපාකද යහපත්ව ඇත. මම දස කුශල්හි යෙදී මියගිය පුද්ගලයා සුගතිගාමී වනු දැක්කෙමි. දස කුශල් කරන සැවොම සුගතියෙහි උපදී. යමෙක් මෙය දැන ගනීද ඔහු ප්‍රඥාවන්තයෙකි. නොදන්නවුන්ගේ දැනුම මෝඝ (හිස්) වෙති. මෙසේ මගේ දැනීම හෙවත් දෘෂ්ඨිය සත්‍ය වෙයි. අන් අයගේ දෘෂ්ඨිය අසත්‍ය වේ.'' යනුවෙනි.

ආනන්දය, ඔහුගේ ඒ කියමන් අතර ''යහපත් කුශල කර්‍ම ඇත. එහි විපාකද ඇත''. එය අනු දනිමි ''දස කුශල් කර මිය පරලොව ගොස් සුගතියෙහි ඉපදෙනු දැක්කෙමි.'' යන්නද අනුමත කරමි. ''දස කුශල් කර මිය යන සැවොම සුගතියෙහි උපදිතියි'' යන කීම අනුමත නොකරමි. ''යම් කෙනෙක් මෙය මෙසේ දනීද තමන් ප්‍රඥවන්තයෙකි යමෙක් නොදනීද ඒ අනුවනයෙකි යි කීමද එය අසත්‍යය ලෙසකින් දකින්නාගේ දැක්ම මිත්‍යාවකිය'' කීමද අනුමත නොකරමි. ඒ කවර හේතුවකින්ද තථාගතයන්ගේ මහා කර්‍ම විභංගය වෙනත් ආකාරයක් නිසාය. එනම් ඉහතකී තෙවැන්නා දස කුශල් කරමින් ජීවත් වූ අතර මරණින් මතු සුගති ගාමී වූයේ ඒ සැපයට හෙතු වූ කර්‍මය බොහෝ බලවත්ව කිරීම හෝ පසුව හෝ මරණාසන්න කාලයේදී සම්‍යග්දෘෂ්ඨිය සම්පූර්‍ණ කොට සමාදන කරන ලද හෝ නිසාය. බලවත් නොවූ සෙසු දස කුශල් කිරීමේ විපාක මෙලොවදී , අනතුරු භවයකදී හෝ ආසන්න භවයකදී හෝ විපාක දෙන්නේමය. (අත්ථි කමමං හබබකෙදවව හබබාසකදච) කුශලය මැඩලන කුශල කර්‍මයක්ද ඇත.

ක හතර වැනි පුද්ගලයාගේ කර්‍මය විභාග කිරීම.

ආනන්දය, සිව්වෙනිව ලොව විද්‍යමාන පුද්ගලයා දස අකුශලයෙන් වැළකී ජීවත්ව මරණිත් මතු නරකයෙහි උපදිනු දැක දිවැස් ඇත්තා මෙසේ කියයි. ''යහපත් කර්‍ම නැත. එම යහපත් කර්‍ම වල විපාක නැත. දස කුශල් කර නිරයෙහි උපදින සත්වයෝ මම දැක්කෙමි. දස කුශල් කරමින් සිට මිය යන සැවොම නරකයෙහි උපදී. යමෙක් මෙසේ දනීද දකීද ඔවුන්ගේ දැනුම යහපත්ය එසේ නොදැනගන්නාගේ දැනුම හිස්ය. මෙසේ ඔහුගේ දැනීම සත්‍යයකි. මේ දැනුමට පරිබාහිර දැනුමක් යමෙක් දැනගනීද එය අසත්‍යය.''

ආනන්දය, ඔහු විසින් කියන ලද "යහපත් කර්‍ම නැත විපාකද නැත''. යන කියමන අනුමත නොකරමි. දස අකුශලයෙන් වැළකී මරණින් මතු නරකයෙහි උපදිනු දකිමි යන්න අනුමත කරමි එය එසේ වනු ඇත. එනමුත් "දස කුශලයෙහි යෙදී සිට මරණයට පත්වන සැවොම මරණින් මතු නිරයෙහි උපදී'' ය යන කීම අනුමත නොකරමි. තවද ''මෙය දන්නා පුද්ගලයා නුවන ඇති අයෙකි නොදන්නේ අනුවනයෙකි මිථ්‍යා දෘෂ්ඨියෙකි. මෙය සත්‍යයකි. වෙනත් දැනීම් අසත්‍යයකි" යන අදහස් අනුමත නොකරමි. ඒ කිනම් හේතුවක් නිසාද ආනන්දය තථාගතයන්ගේ මහා කම්ම විභංග ඥාණය වෙනත් ආකාරයක් නිසාය. ඉහතකී සිව්වෙනි පුද්ගලයා දස අකුසලයෙන් වැළකී ජීවත්ව මරණින් මතු දුගතියෙහි ඉපදීමට හේතු වූ ඒ පාප කර්‍මය බොහෝ කරන ලද හෝ පසු කාලයෙහි හෝ කර ඇත. ඔහු මරණාසන්න කාලයෙහි මිත්‍යාදෘෂ්ඨිය සම්පූර්‍ණ කර හෝ සමාදන් කරන ලද හෝ වෙයි. මෙලොවදී දස

අකුශලයෙන් වෙන්ව සම්‍යග් දෘෂ්ඨිකව සිටියේද එහි විපාක මෙලොවදී හෝ දෙවන භවයේදී හෝ වෙනත් භවයකදී හෝ විඳින්නේමය. (අත්ථි කමමං අභබබං භබබාසං) කුශලය මැඩලන්නාවූ අකුශල කර්‍මයක්ද ඇත. මේ දේශනාව භාග්‍යවතුන් වහනසේ අවසාන කිරීමත් සමග ආනන්ද තෙරණුන් වහන්සේ සතුටු සිතින් එම බුදධ වචනය අනුමෝදන් වූ බව සූත්‍රයේ දැක්වේ. නිවන හෙවත් සසර ගමන නතර කිරීම බෞද්ධයාගේ (තෙරුවන් සරණ ගිය තැනැත්තාගේ) මූලික අරමුණ විය යුතුයි. අවබෝධය කා හටත් සමසේ උපකාර වේ.

කර්‍මය හා කර්‍ම විපාකය පිළිබඳව පමණ ඉක්මවා නොසිතිය යුතු කරුණු අතරින් එකක් බව බුදු හිමියන්ගෙන් අවසර ලැබී ඇත. එනමුත් උන්වහන්සේ කර්‍මය පිළිබඳව දක්වා ඇති ප්‍රමාණත්වූ මේ දැනුම බුදු දහමට අනුව ජීවත්වන සෑම පුද්ගලයෙකුටම සසර දුකින් එතෙර වීමට හේතු වනු ඇත. මෙම මහා කම්ම විභංගය තේරුම් නොගන්නා දිවැස් ඇත්තාට ද වරදින්නේ නම් අප ගැන කවර කථාද. නූතන සමාජය කර්‍මය තමන්ගේ වාසියට බෙදා හදා ගෙන ඇත. එනමුත් මජ්ඣිම නිකායේ චුල්ල කම්ම විභඞ්ග සූත්‍රය දක්වන පරිදි තෝදෙය්‍ය නම් බමුණාගේ එකම පුතාවූ සුභ මානවක සමාජය වෙළාගෙන පවතින දැවෙන ප්‍රශ්ණයක් විසඳා ගැනීමට උනන්දුවිය. එනම් සමාජගත මනුෂ්‍යයින් තුළ දක්නට ලැබෙන විවිධ වෙනස්කම් (උසස්, පහත්, දුප්පත්, පොහොසත් ආදී වීමට) හේතු දැනගැනීමටයි. බුදු හිමියන්ගේ පිළිතුරු වූයේ "කමමසසකා මානව, සත්තා කමම දයාද කමම යොනි කමම බන්ධූ කමම පටිසරණා කමමං සතෙත විභජති හීනපපනීත තායාති" මානවකය සත්වයෝ කර්මය තමන් අයිතිකොට දයාද කොට ඇත. ඉපදීමේ මූලය කොට ඇත, ඥාති කොට ඇත, පිහිට කොට ඇත.ඒ නිසා කර්‍මය සත්වයාගේ උස් පහත් භාවයට හේතු වී ඇත යනුවෙනි. එද එසේ විමසුවද අද එසේ විමසීමක් නැත.

මහා කම්ම විභංගය යනු බුදු නුවනින් දුටු තුන් ලෝක ධාතුව තුළ කිසිවෙකු විසින් නුදුටු කර්‍ම විපාක බෙදා දැක්වීමයි. සාමාන්‍ය ලෝකය තුළ අප හිතන ආකාරයට වඩා විශාල වෙනසක් කර්‍ම විපාක දීමේදී බුදුරජාණන් වහන්සේ විසින් දැක ඇත. සූත්‍රයෙහි දැක්වෙන පරිදි දස අකුශල් අතර බලවත් අකුශල කර්‍මයක් වූ මිත්‍යාදෘෂ්ඨිය අප ජීවිත දුකට ඇද දැමීමට කොතරම් හේතු වනු ඇත්දැයි වැටහේ මෙම තථාගත කර්‍ම විභංගය හොඳින් දැන ඉගෙන ගැනීම බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් අනවබෝධයෙන් දැඩි වෙහෙසින් සහ වියදම් කොට සිදුකරන මහා අලංකාර පිංකමකට වඩා අගය කළ හැකිය. අද බුද්ධශාසනයට සිදු වී ඇති බලවත්ම ව්‍යසනය වන්නේද මිථ්‍යා පිළිගැනීම් බෞද්ධයා තුල බලවත්ව ඇති වීමයි. පසුගිය දිනක මාධ්‍ය තුලින් අසන්නට දකින්නට ලැබුනේ එක්තරා දේවාලයකට පිහිට පතා ගිය කාන්තාවකට දේවාලයෙන් ලබාදුන් දියරයක් පානය කිරීමෙන් මරණයට පත් වූ බවයි. සිදුවූයේ කුමක්ද? දෙවියන්ගේ පිහිට පතාගිය ඇයටත් පිහිට ලබාදීමට අතර මැදියා වූ දේවගැති වරයාත් දෙදෙනාම දුකට පත් වීමය. කර්‍මය සහ කර්‍ම විපාක නොදන්නා කම හෙවත් මිථ්‍යා විශ්වාසයේ වරද නිසාය. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්‍මය මනාකොට

දේශනා කොට ඇත. (සවක්ඛාතො භගවතා ධම්මො) එනමුත් බොහෝ දෙනා හිතන්නේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය අඩුපාඩු සහිතය. වෙනත් ඇදහීම් විශ්වාස තුළ අඩුපාඩු නැත කියාය. බොහෝ ප්‍රාණඝාත කළ අයෙකු පූර්ණ ආයුෂ විඳිනු දැක එසේ වන්නේ කෙසේ දැයි තම සිතින් ප්‍රශ්ණ කරයි. ඒ මහා කම්ම විභංගය නොදන්නාකම නැමැති තම වරදයි. එබැවින් තථාගතයන් වහන්සේ වදළ මහා කම්ම විභංගය තේරුම්ගෙන සිතාමතා කර්ම සිදුකොට සසර දුකින් නිදහස් වෙමු.

